**රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව**

**වෙත යොමු කරන ලද**

**දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත**

**සම්බන්ධයෙන්**

**රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ වාර්තාව**

**පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද්දේ**

**රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති**

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා, පා.ම. විසිනි**

**2025 සැප්තැම්බර් මස 24 වැනි බදාදා**

---

**ஆளுகை, நீதி மற்றும் சிவில் பாதுகாப்பு பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவிற்கு**

**ஆற்றுப்படுத்தப்பட்ட**

**தண்டனைச் சட்டக்கோவை (திருத்தம்) சட்டமூலம்**

**மீதான**

**ஆளுகை, நீதி மற்றும் சிவில் பாதுகாப்பு பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவின் அறிக்கை**

**ஆளுகை, நீதி மற்றும் சிவில் பாதுகாப்பு பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவின் தவிசாளர்**

**கௌரவ (டாக்டர்) நஜீத் இந்திக்க, பா.உ., அவர்களால்**

**பாராளுமன்றத்திற்குச் சமர்ப்பிக்கப்பட்டது.**

**2025 செப்டெம்பர் 24 ஆம் திகதி புதன்கிழமை**

---

# Report of the
# Sectoral Oversight Committee on Governance, Justice and Civil Protection
# on
# Penal Code (Amendment) Bill

**referred to Sectoral Oversight Committee on Governance, Justice and Civil Protection**

**Presented to Parliament by**

**Hon. (Dr.) Najith Indika,M.P.**

**Chair of the Sectoral Oversight Committee on**
**Governance, Justice and Civil Protection**

**Wednesday, 24 September 2025**

## කාරක සභාවේ වාර්තාව

2025 සැප්තැම්බර් මස 23 වන දින පාර්ලිමේන්තුවේදී රැස් වූ රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් පහත සඳහන් පනත් කෙටුම්පත සලකා බලන ලදී.

- දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත
(2025 අගෝස්තු මස 19 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලදුව රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලදී.)

**සහභාගී වූ කාරක සභික මන්ත්‍රීවරුන්:**
ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා, පා.ම. (සභාපති)
ගරු මුජිබුර් රහුමාන් මහතා, පා.ම.
ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා, පා.ම.
ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය, පා.ම.
ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මහතා, පා.ම.
ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා, පා.ම.

**සහභාගී වූ කාරක සභික නොවන මන්ත්‍රීවරුන්:**
ගරු අජිත් පී. පෙරේරා මහතා, පා.ම.,
ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය, පා.ම.,
ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය, පා.ම.,
ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා, පා.ම.,

චූලා හේරත් මහත්මිය, සහකාර අධ්‍යක්ෂ(පරිපාලන) - කාරක සභාවේ ලේකම්

**සහභාගී වූ නිලධාරීන්**
**නීතිපති දෙපාර්තමේන්තුව**
සජිත් බණ්ඩාර මහතා, රජයේ නීතිඥ

**නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව**
ඩී.එම්.කේ.ඩී.කේ. දිසානායක මහත්මිය, සහකාර නීති කෙටුම්පත් සම්පාදක

**අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය**
පියුමන්ති පීරිස් මහත්මිය, අතිරේක ලේකම් (නීති)
චන්දිමා වැලිකල මහත්මිය, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (නීති)
ලිලානී ගනේගම මහත්මිය, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයාගේ කාර්යය මණ්ඩලය

**කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය**
කුමුදු පෙරේරා මහත්මිය, නීති නිලධාරී

**ශ්‍රී ලංකා නීති විද්‍යාලය**
ජනාධිපති නීතිඥ ඩබ්ලිව්.එම්. ප්‍රසාන්ත ලාල් ද අල්විස් මහතා, විදුහල්පති

**හැඳින්වීම**
දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත, (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහය (ශාරීරික දඬුවම්) සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි. ශාරීරික දඬුවම් මඟින් දරුවෙකුට සිදු වන ශාරීරික හා මානසික හිංසනය පුළුල් බව විද්‍යාත්මකව ඔප්පු කර තිබේ. එබැවින්, ඕනෑම ක්ෂේත්‍රයක ශාරීරික දඬුවම් මඟින් හිංසනයට ලක් කිරීම තහනම් කිරීම සඳහා සහ ශාරීරික හිංසනය වෙනුවෙන් දඬුවම් නියම කිරීම සඳහා විධිවිධාන පැනවීම පිණිස (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහය සංශෝධනය කිරීම අරමුණු වේ.

**කාරක සභා නිරීක්ෂණ**
1. "ඕනෑකමින්ම" යන්න, සැලසුම් සහගත ක්‍රියාවක් ලෙස ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අර්ථ දක්වා ඇති නිසා, ක්ෂණිකව සිදුවන කෲර ක්‍රියා සම්බන්ධයෙන් නඩු පැවරීම අපහසු වූ බවත්, මෙම පනත් කෙටුම්පත මඟින් 308අ වගන්තියේ තිබූ "ඕනෑකමින්ම" (wilfully) යන වචනය, "චේතනාව" (intentionally) ලෙස වෙනස් කිරීමෙන්, අනෙකුත් බරපතළ අපරාධ සඳහා භාවිතා වන සම්මතයන් සමග අනුගත කිරීමට හැකි වන බව

2. ගුරුවරුන් විසින් දඬුවම් ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා පාසල් ශිෂ්‍ය නායකයින් වැනි වයස අවුරුදු 18ට අඩු වරදකරුවන් සඳහා වන දඬුවම ලිහිල් කර ඇති අතර එය මාස හයකට වඩා අඩු කාලයකට බන්ධනාගාරගත කිරීමක් විය හැකි බව
3. අපරාධ නඩු විධාන සංග්‍රහයට ඉදිරියේ දී ගෙන ඒමට යෝජිත සංශෝධනය මඟින් දණ්ඩනය නියම කිරීමේ දී විනිශ්චයකාරවරයාගේ අභිමතය පරිදි සිර දඬුවමක් නියම නොකර වෙනත් දඬුවමක් ලබා දීමට ද, ඊට අමතරව මනෝවිද්‍යාත්මක ප්‍රතිකාර ලබා දීමේ තීරණය ද ලබා දිය හැකි වනු ඇති බවත්, මෙමඟින් ගුරුවරුන්ගෙන් පෞද්ගලිකව පළිගැනීම සඳහා මෙම නීතිය අනිසි ලෙස භාවිතා කිරීම වැළැක්වෙනු ඇති බව
4. දණ්ඩ නීති සංග්‍රහයේ 74 වගන්තිය හා අපරාධ නඩු විධාන සංග්‍රහයේ 303, 306 සහ 307 වගන්ති මඟින් මේ වන විටත් ගුරුවරුන්ට නෛතිකව ආරක්ෂාවක් ලැබෙන බව

**කාරක සභාවේ තීරණ**

සලකා බැලීමෙන් අනතුරුව, කාරක සභාව දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් එකඟ වූ අතර, ඒ පිළිබඳව සකසන ලද කාරක සභාවේ මෙම වාර්තාව කාරක සභාවේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා විසින් 2025 සැප්තැම්බර් මස 24 වැනි බදාදා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි තීරණය කරන ලදී.